# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2496/30 - 2026 ජූලි මස 09 වැනි බ්‍රහස්පතින්දා - 2026.07.09**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

විධාන අංක - 98

**2003 අංක 9 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත (සංශෝධිත)**

12(2) වගන්තිය යටතේ විධානය

2003 අංක 9 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 12(2) වැනි වගන්තිය මගින් පැවරී ඇති බලතල ප්‍රකාරව, සැකසූ දියර කිරි (Processed Liquid Milk) සඳහා වන ඇෆලටොක්සින් මට්ටම, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් සැකසූ දියර කිරි (Processed Liquid Milk) සඳහා ප්‍රකාශිත ශ්‍රී ලංකා ප්‍රමිති පිරිවිතර SLS 1815 හි නියම කර ඇති උපරිම සීමාව වන 0.5 µg/kg (ppb) ට අනුකූලවන්නේ නම් මිස, සැකසූ දියර කිරි (Processed Liquid Milk) නිෂ්පාදනය, සෑදීම, ආනයනය, ඇසුරුම් කිරීම, සැපයීම, ගබඩා කිරීම, බෙදාහැරීම, ප්‍රවාහනය කිරීම, විකිණීම හෝ විකිණීම සඳහා ඉදිරිපත් කිරීම හෝ විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීම නොකළ යුතු බවට සියලු ම නිෂ්පාදකයින්, සාදන්නන්, ආනයනකරුවන්, ඇසුරුම්කරුවන්, සපයන්නන්, ගබඩාකරුවන්, බෙදාහරින්නන්, ප්‍රවාහනය කරන්නන් හා වෙළෙන්දන් වෙත මෙයින් විධානය කරනු ලැබේ.

මෙම විධානය 2027 ජනවාරි මස 08 වන දින සිට බලපැවැත්වෙනු ඇත.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අණ පරිදි,

**එස්. එම්. ඩී. සූරියකුමාර,**
සභාපති (*වැ.බ.*).

2026 ජූලි මස 09 වැනි දින,
කොළඹ දී ය.

EOG 07 - 0145


1A - PG 7795 — 53 (2026/07) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*